## අගලවත්ත ප්‍රාදේශීය සභාව

අගලවත්ත ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුර සඳහා බඳවා ගැනීම- මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.:

| අනු. අංකය | තනතුරු නාමය | පුරප්පාඩු ගණන | අධ්‍යාපන සුදුසුකම් | | වෙනත් | වැටුප් පරිමාණය |
|---|---|---|---|---|---|---|
| | | | අභ්‍යන්තර | බාහිර | | |
| 01 | සෞඛ්‍ය පරිපාලක | 01 | අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී භාෂාව සහ ගණිතය ඇතුළුව යටත් පිරිසෙන් සම්මාන 02ක් සහිතව විෂයයන් 06කින් සාමාර්ථය ලබා තිබීම. (මින් විෂයයන් පහක් (05) එකවර සමත් වී තිබිය යුතු ය.) | සිංහල/දෙමළ/ ඉංග්‍රීසි භාෂාව ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථය-න් සහිතව එකවර විෂයයන් හයකි-න් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම සහ අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාග යේදී අවම වශයෙන් විෂයයන් එකක්වත් (01) (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම. | (අභ්‍යන්තර අයදුම්කරුවන්) පළපුරුද්ද: අදාළ පළාත් පාලන ආයතනයේ PL - 1 හා PL -2 වැටුප් කේත අංක යටතේ වැටුප් ලබන, සේවය ස්ථිර කර ඇති හා වසර (05) සපුරා ඇති සේ-වකයින් විය යුතු අතර මෙම කාලය ආයතන ප්‍රධානියා ලිඛිතව සනාථ කල යුතුය. (බාහිර අයදුම්කරුවන්ට) පළපුරුද්ද අදාළ නැත. | (MN- 1 2016) රු.27,140- 10x300- 11x350-10x495- 10x660 - රු.45,540 1 වන කාර්යක්ෂමතා කඩඉම III ශ්‍රේණියට බඳවාගෙන වසර 03 ක් ගතවීමට පෙර (ලිඛිත පරීක්ෂණය) |

*බඳවා ගැනීම :*

සියළුම අයදුම්කරුවන් ලිඛිත පරීක්ෂණයකට භාජනය විය යුතු අතර එම පරීක්ෂණයේදී ලකුණු ලබා ගන්නා කුසලතා අනුපිළිවෙළ අනුව පුරප්පාඩු පුරවනු ලැබේ.

*විවෘත බඳවා ගැනීම :*

| විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| අභියෝගතාවය හා බුද්ධි පරීක්ෂණය | 100 | 40% |
| කාලීන සිදුවීම් පිළිබඳ සාමාන්‍ය අවබෝධය | 100 | 40% |

*සීමිත බඳවා ගැනීම :*

| විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්ෂණය | 100 | 40% |
| ක්ෂේත්‍රයට අදාල දැනුම පරීක්ෂ කිරීම | 100 | 40% |

02. *බඳවා ගැනීමේ පොදු කොන්දේසි :*

i. ශ්‍රී ලාංකිකයෙකු විය යුතුය.

ii. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු 30ට නොවැඩි විය යුතුය. දැනට රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක යෙදී සිටින අයට උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.

iii. බස්නාහිර පළාත තුළ යටත් පිරිසෙන් අවුරුදු 3ක ස්ථිර පදිංචිය ඇති අයෙකු විය යුතුය.

iv. යහපත් චරිතයකින් හා මනා ශාරීරික සෞඛ්‍ය තත්වයකින් යුක්ත විය යුතුය.

v. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවකු වී දඬුවම් ලැබූවෙකු නොවිය යුතුය.

vi. රජයේ හෝ පළාත් පාලන සේවයෙන් පහකරනු නොලැබූ අයෙකු විය යුතුය.

vii. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 44/90 යටතේ විශ්‍රාම ලැබූවකු නොවිය යුතුය.

viii. අගලවත්ත ප්‍රාදේශීය සභාවේ දැනට අනියම්, ආදේශක, ව්‍යාපෘති, කොන්ත්‍රාත් (වැඩ ඒකක) සේවය කරනු ලබන සේවකයින් කෙරෙහි වැඩි අවධානයක් යොමු කරනු ලැබේ.

03. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*

i. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. තුන් අවුරුදු පරිවාස කාලයකට යටත් වේ.
ස්ථිර සේවකයින් අවුරුදු 01ක වැඩ බැලීමේ කාලයකට යටත් වේ.

ii. වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය.

iii. රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියට එකඟ විය යුතුය.

iv. මෙම බඳවා ගැනීමේ කොන්දේසි රෙගුලාසිවලට අමතරව ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලටද, රජයේ මුදල් රෙගුලාසිවලටද, රජයේ දෙපාර්තමේන්තු නියෝගවලට ද බස්නාහිර පළාත් සභාව හෝ අගලවත්ත ප්‍රාදේශීය සභාව විසින් වරින් වර නිකුත් කෙරෙන රෙගුලාසි හා නියෝගවලට අනුකූලව කටයුතු කිරීමට බැඳී සිටිය යුතුය.

04. සුදුසුකම් ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන අතර, පහත සඳහන් ලියකියවිලි වල ඡායා පිටපත් අමුණා තිබිය යුතුය.

i. උප්පැන්න සහතිකය,

ii. අධ්‍යාපන සහතිකය,

iii. ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපත,

iv. පදිංචිය පිළිබඳ ප්‍රාදේශීය ලේකම්ගේ සහතිකය,

v. මෑතකදී ලබා ගත් චරිත සහතික දෙකක් (මින් 1ක් ග්‍රාම නිලධාරීගෙන් ලබාගත් එකක් විය යුතුය.)

vi. පළපුරුදු පිළිබඳ සහතිකය

vii. වෙනත් සුදුසුකම් පිළිබඳ සහතිකය

05. *අයදුම්කළ යුතු ආකාරය :*

මෙම නිවේදනයේ ආදර්ශ ආකෘතිය පරිදි 12"x8" ප්‍රමාණයේ අයදුම්පත් සකස්කර, ඉල්ලුම් කරන තනතුර අදාළ කවරයේ වම්පස ලියා අංක 4 ඡේදයේ දක්වා ඇති ලියකියවිලි ද සමගින් 2018.09.14 වැනි දින හෝ එදිනට පෙර ලේකම්, අගලවත්ත ප්‍රාදේශීය සභාව, අගලවත්ත යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

ලලනි දීපිකා උඩුමුල්ල,
ලේකම්,
අගලවත්ත ප්‍රාදේශීය සභාව.

ආදර්ශ අයදුම්පත්‍රය

*අගලවත්ත ප්‍රාදේශීය සභාව*

***අගලවත්ත ප්‍රාදේශීය සභාවේ සෞඛ්‍ය පරිපාලක තනතුර සඳහා අයදුම්පත්‍රය***

1. අයදුම්කරුගේ නම මුලකුරු සමඟ : ..................................................................................
2. මුලකුරුවලින් හැඳින්වෙන නම් : ..................................................................................
3. ස්ථිර ලිපිනය : ..................................................................................
4. ග්‍රාම නිලධාරි කොට්ඨාසය : ..................................................................................
5. දිස්ත්‍රික්කය : ..................................................................................
6. උපන් දිනය : අවුරුද්ද: ................................ මාසය:........................... දිනය:..........................................
7. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට (2018.09.14) වයස: අවු:.................... මාස: ................ දින :.................
8. ස්ත්‍රී පුරුෂ භාවය : ..................................................................................
9. විවාහක/අවිවාහක බව : ..................................................................................
10. ශ්‍රී ලංකා පුරවැසියෙක් ද එසේ නම් පරම්පරාවෙන් ද ලියාපදිංචි වීමෙන් ද යන වග: ....................................
11. ජාතික හැඳුනුම්පත් අංකය : ..................................................................................
12. දුරකථන අංකය : ..................................................................................
13. අධ්‍යාපන සුදුසුකම් : අ.පො.ස. සා. පෙළ

වර්ෂය : ......................................................
විභාග අංකය : ....................................................

| *විෂය* | *ශ්‍රේණිය* | *විෂය* | *ශ්‍රේණිය* |
|---|---|---|---|
| | | | |

අ.පො.ස. උ. පෙළ
වර්ෂය : ......................................................
විභාග අංකය : ....................................................

| *විෂය* | *ශ්‍රේණිය* | *විෂය* | *ශ්‍රේණිය* |
|---|---|---|---|
| | | | |

14. වෘත්තීය හා වෙනත් සුදුසුකම් (ඇත්නම්) : ..................................................................................

මෙම අයදුම්පත්‍රයෙහි මා විසින් සපයා ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි නිවැරදි බවට ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීමේ කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති බව බඳවා ගැනීමට පෙර හෝ පසුව අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහකරනු ලැබීමට යටත් වන බව ද දනිමි.

..................................................................
අයදුම්කරුගේ අත්සන.

දිනය: ....................................

08 - 989